| | | | |
|---|---|---|---|
| දුරකථන / தொலைபேசி / Telephone | ) 2698475<br>) 2698490<br>) 2698507 | මගේ අංකය / எனது இல / My No. | ) |
| ෆැක්ස් / பெக்ஸ் / Fax | ) 2692913<br>) 2694860<br>) | ඔබේ අංකය / உமது இல / Your No. | ) |
| විද්‍යුත් තැපෑල / மின்னஞ்சல் முகவரி / e-mail | ) postmaster@health.gov.lk | දිනය / திகதி / Date | ) 13.01.2012 |
| වෙබ් අඩවිය / இணையத்தளம் / website | ) www.health.gov.lk | | |


සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

# සෞඛ්‍ය අමාත්‍යාංශය
# சுகாதார அமைச்சு
# Ministry of Health

පොදු චක්‍රලේඛ ලිපි අංක : 02 -10/2012

දිනය :2012.01.

සියළුම පළාත් සෞඛ්‍ය සේවා හා දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකවරුන්,
සියළු සෞඛ්‍ය ආයතන ප්‍රධානීන්
මහනගරසභා ප්‍රධාන සෞඛ්‍ය වෛද්‍ය නිළධාරිවරුන්
සෞඛ්‍ය වෛද්‍ය නිළධාරිවරුන් වෙත

**ශ්‍රී ලංකාවේ බෝනොවන රෝගවලට ප්‍රධාන සාධකයක් වන සීනි පාරිභෝජනය අඩුකිරීමට ජනතාව පෙළඹවීම.**

මාගේ සමාංක හා 2011.11.04 දිනැති අංක 01-32/2011 දරන පොදු චක්‍රලේඛ ලිපියට අමතර වශයෙනි.

දැනට ශ්‍රී ලංකාව තුල දියවැඩියාව වැනි බෝනොවන රෝගවලට ලක්වන ජන ප්‍රතිශතය ඉතා ඉහල මට්ටමක පවතින බැවින් එම තත්වය පාලනය සඳහා දැනුවත්කිරීමේ වැඩසටහන්වලට අමතරව සේවා සපයන්නන් ස්වෙච්ඡාවෙන් මෙම කටයුත්ත සඳහා දායක කර ගැනීම තුළින් ජනතාව දෛනිකව පාරිභෝජනය කරන සීනි ප්‍රමාණය ක්‍රම ක්‍රමයෙන් අඩු කිරීමට සුදුසු පියවර ගතයුතු බවට සෞඛ්‍ය අමාත්‍යංශයේ ආහාර උපදේශක කමිටුව තීරණය කර ඇත.

ඉහත තීරණ ක්‍රියාත්මක කිරීමට පහත උපදෙස් අනුගමනය කිරීම සඳහා 1980 අංක 26 ආහාර පනත යටතේ පත්කර ඇති බලයලත් නිළධාරීන්ට උපදෙස් ලබාදෙන ලෙස කාරුණිකව ඉල්ලමි.

1. හෝටල්, තේපැන් ශාලා වැනි තේ, කෝපි, කිරි තේ හා කිරි කෝපි සකස්කර පිළිගන්වන ආයතන වල ඒවා සීනි රහිතව සකස්කර සීනි බඳුන සහ තේ හැඳි වෙනම සපයාදී පාරිභෝගිකයාට අවශ්‍ය පරිදි සීනි යොදා ගැනීමට හැකිවන ආකාරයට පහසුකම් සලසන ලෙස ආහාර පරිහරණ ආයතනවලට උපදෙස් ලබාදීම හා මෙම ක්‍රියාවලිය ස්වෙච්ඡාවෙන් ඉටුකරගැනීමට කටයුතු කිරීම.

2. ඉහත 1 හි සඳහන් පරිදි සීනි බඳුන වෙනම සපයා ඇති විට එම සීනි බඳුනෙහි පහත සඳහන් පාඨය ඇතුලත් ස්ටිකරයක් අලවා තැබීමට ආහාර පරිහරණ ස්ථාන හිමිකරුවන්ට උපදෙස් ලබාදීම.

**"සීනි අඩුවෙන් පරිභෝජනය කර දියවැඩියාව වැනි රෝග වලින් වලකිමු."**

මෙමගින් මාගේ සමාංක චක්‍රලේඛ ලිපිය මගින් දක්වා ඇති පුහුණු වැඩසටහන් වලින් දැනුවත් වූ පාරිභෝගිකයන්ට එම දැනුම ප්‍රායෝගික ලෙස ක්‍රියාත්මක කිරීමට ඉඩපහසුකම් ලැබෙනු ඇත.

වෛද්‍ය යූ. ඒ. මෙන්ඩිස්
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
සෞඛ්‍ය අමාත්‍යාංශය
පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
385, "සුවසිරිපාය"
කොළඹ 10.

වෛද්‍ය යූ.ඒ.මෙන්ඩිස්
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
(ප්‍රධාන ආහාර බලධරයා)

පිටපත:
1. පළාත් සෞඛ්‍ය ලේකම්, පළාත් සෞඛ්‍ය අමාත්‍යංශය/.............................. පළාත
2. වෛද්‍ය නිළධාරි/බෝනොවන රෝග ඒකකය,..................................................